
# පෙර පාසැල් ගිය හැටි

නදියේෂ්දා කලීනිනා



නදියේෂ්දා කලීනිනා

# පෙර පාසැල් ගිය හැටි





චිත්‍ර
වෙනියමින් ලෝසීන්

පරිවර්තනය
රන්ජන දේවමිත්‍ර සේනාසිංහ



Kanol



# සාෂායි අලෝෂායි ගැන

විසාල මහල් නිවාසයක පස් වැනි තට්ටුවේ සාෂායි අලෝෂයි කියලා ළමයි දෙන්නෙක් ඉන්න පවුලක් ජීවත් වුණා. මේ දෙන්නා ටිකක් ලොකු වුණාට පස්සෙ දවසක් දා අම්මයි තාත්තයි මෙහෙම කිව්වා.

“මේ කොල්ලො දෙන්නව පෙර පාසැල් යවන්න දැන් කාලෙ හරි”

සාෂා සන්තෝෂ වුණා.

“පෙර පාසැල්, පෙර පාසැල්, අපි යනවා පෙර පාසැල්”

එතකොට අලෝෂා මෙහෙම ඇහුවා.

“මොකක්ද ඔය පෙර පාසැල කියන්නෙ? එතැන මොනවද කෙරෙන්නෙ?”

“පෙර පාසැලට ගිහිල්ලම ඕනැ බලාගන්න. ඊට පස්සෙ අපිටත් කියන්නකො” කියලා තාත්තා කිව්වා.

එතකොට අම්මා මෙහෙම කිව්වා.

“පෙර පාසැලට ගියාම ඔයගොල්ලන්ට යාලුවෝ ගොඩාක් හම්බ වෙනවා. එතකොට හැමෝටම එකතු වෙලා සෙල්ලම් කරන්න, ඇවිදින්න, පාඩම් කරන්න පුළුවන්”



# සාෂායි අලෝෂයි
# පෙර පාසැල් ගිය හැටි

සාෂායි අලෝෂයි අම්මත් එක්ක පෙර පාසැලට ගියා. අලෝෂාට බය හිතුණා. එයා හිටියේ අම්මගේ අතින් ඇදගත්ත ගමන්.

"ආපහු ගෙදර යමු"

සාෂා බය නෑ. එයා ළමයින් දිහා බලාගෙන හිටියා.

කොණ්ඩ දෙකක් ගොතපු ගෑනු ළමයෙක් දුවගෙන ආවා.

"මම අපේ ටීචර්ට එන්න කියන්නම්කො" කියලා ඈ ආපහු දුවලා ගියා. කුඩා දරුවන්ගේ පන්තිය භාරව ඉන්න ගුරුතුමිය ඇවිත් අම්මා හමුවෙලා කොලු පැටවුන් දෙන්නා දිහා බලලා මෙහෙම කිව්වා.

"ආයුබෝවන් සාෂාටයි අලෝෂාටයි. හැබැයි ඔය දෙන්නගෙන් කවුද සාෂා කවුද අලෝෂා කියලා මං දන්නේ නෑ. එහෙනම් හරියයිද බලන්න කියන්නද? අලෝෂා වෙන්න ඕනැ ඉස්සරහින් ඉන්නෙ. කිසි දේකට බය නෑ. අම්මට මුවා වෙලා හැංගිලා ඉන්නේ සාෂා වෙන්න ඇති."

සාෂාට හිනා ගියා.

"අලෝෂායි හැංගිලා ඉන්නෙ"

"එහෙනම් අලෝෂාද මේ මාත් එක්ක හැංගිමුත්තම් කරන්නෙ? අන්න ඔයාටම කියලා පැදුර උඩ සෙල්ලම් බඩු ගොඩාක් දාලා තියෙනවා. රාක්කයක් පිරෙන්න තියෙනවා ලොකු හතරැස් පෙට්ටි වාගේ කෑලි ගොඩාක්. ඒවායින් නැවක් හදන්න පුළුවන්"

ගුරුතුමිය කතා කළේ හරි සන්තෝසෙන්, හරිම ලෙන්ගතු විදියට තමයි ළමයින් දිහා බැලුවේ. එක අතකින් සාෂාගේත් අනෙක් අතින් අලෝෂාගේත් ඔළුව අතගාන ගමන් ඈ මෙහෙම කිව්වා.

"ඉක්මනට ඔය වැහි කබා ගලවන්න. අලෝෂා, මේ ඔයාගේ කබඩ් එක. මේක සාෂාගේ. ඔය වැහි කබා එල්ලන්නේ මෙතන. තොප්පි ගලවලා තියන්න ඕනෑ උඩ රාක්කෙන්. අනෙක් ළමයි වගේ සපත්තු ගලවලා යට තියෙන සපත්තු රාක්කෙන් තියන්න ඕනැ. තමන්ගෙ කබඩ් එක වරදින්නේ නැතිව පහසුවෙන් හොයාගන්න අපි ඒකේ පින්තූරයක් අලවනවා"

ළමයි දුවලා ගිහින් ගම් කුප්පියකුයි, මැලියම් තවරන පුංචි පින්සලයකුයි, පින්තූර දෙකකුයි අරගෙන ආවා. එකක ගුවන් යානයකුත් තවත් එකක අස්සයකුත් ඇඳලා තිබුණා. ගුරුතුමිය සාෂාගේ කබඩ් එකේ ගුවන් යානයත් අලෝෂාගේ කබඩ් එකේ අස්සයවත් ඇලෙව්වා.

මේ වගේම අස්සයෙක් ඉන්නවා අපේ සෙල්ලම් බඩු කාමරේ.

"අපේ අස්සයා හරිම ලොකුයි, ඌට රෝදත් හයිකරලා තියෙන්නෙ" කියලා ළමයි කෑගැහුවා. "යමු, අපි පෙන්නන්නම්"

"එහෙනම් ඔයාලා යන්න" අම්මා අලෝෂාටයි සාෂාටයි කිව්වා. "අම්මාත් මෙතනින්ම වැඩට යනවා. දැනටමත් පරක්කුයි. දඟකරන්න එහෙම එපා, මං හැන්දෑවට ඔයාලා දෙන්නව එක්කාගෙන යන්න එනවා."









# මේ විදියටත් හැබෑට සෙල්ලම් කරනවද?

පුංචිම ළමයින් ඉන්න පන්තියට සාෂායි අලෝෂායි ආවා. ඒ දෙන්නා සෙල්ලම් බඩු තියෙන තැනට ළං වුණා. සෙල්ලම් බඩු මහා ගොඩයි. වලස්සු, හාවො, බෝනික්කො, ඒ අයටම ගෙනාපු පිඟන් කෝප්ප, ඒ අය නිදි කරවන ඇඳන්, කාර්, ලොරි, ගිනි නිවන රථ, සුදු පාට අස්සයකු පිටේ යන දුඹුරු පාට වලහෙක්. මේ වාගේ හැම දෙයක්ම සෙල්ලම් බඩු කාමරේ තිබුණා. මහා ගොඩයි.

මේවා දිහා බලපු අලෝෂාට මොන සෙල්ලම් බඩුව ගන්නද මොකක් අරගෙන සෙල්ලම් කරන්නද කියලා හිතාගන්න බැරිවුණා. සාෂා විනාඩියක් විතර හැම සෙල්ලම් බඩුවක් දිහාම බලාගෙන හිටියා. එයාට ඕනෑ වුණේ එක පාරම ඔක්කෝම සෙල්ලම් බඩු ටික ගන්න.

සෙල්ලම් බඩු කාමරේ ඇතුළට දුවගෙන ගිය සාෂා වලහෙකු අරගෙන නිකට යටට හිර කර ගත්තා, හා පැටියකුව සාක්කුවට දා ගත්තා, ඇඳකුත් ගත්තා, පිඟන් කෝප්පත් ගත්තා, බල්ලකුවත් ඇදලා අරගෙන මේ ඔක්කොම එක ගොඩකට ගොඩගැහුවා.

"මේවා අල්ලන්න එපා, අරගන්නත් එපා, මේවා මං සෙල්ලම් කරන්න ගත්ත ඒවා"

මේ කරන වැඩේ දැකලා පුදුමවුණු අනෙක් ළමයි ගුරුතුමිය දිහා බැලුවා.

"මෙයා නම් පුදුම කොල්ලෙක්නෙ. මෙහෙමද හැබෑට සෙල්ලම් කරන්නෙ?"

# උදව් කරපු හැටි

ළමයි දිවා ආහාරය ගන්න වාඩි වුණා. සාෂාත් එක්ක ළඟින් වාඩි වුණේ ලේනච්කා කියන ගෑනු ළමයා. ලේනච්කා හරිම හොඳ ගෑනු ළමයෙක්. ඒ වුණාත් ලේනච්කා කෑම කෑවෙ හරිම නරක විදියට. එක සුප් හැන්දක් බීලා වටේ ඉන්න හැම දෙනා දිහාම බලනවා. ඒ වෙලාවෙදි ගුරුතුමිය ලේනච්කාට මෙහෙම කිව්වා:

"ඉක්මනින් කෑම කන්න පුරුදුවෙන්න ඕනැ. නැත්නම් හීතල වෙලා රස නැතිවෙනවා" එහෙම කිව්වත් ලේනච්කා කෑම කෑවෙ පුරුදු විදියට හෙමින්මයි. ඒ වුණාත් සාෂා එක හැන්දක් බීලා ඉවර කරපු ගමන් තවත් හැන්දක් අරගෙන බීලා අනික් සියලුම දෙනාටම කලින් කෑම කාලා අවසන් කළා.

"මම සුප් ඔක්කොම බිව්වා. දැන් මගේ පිඟානෙ මොකුත් නෑ"

සාෂා දැන් ලේනච්කාගේ පිඟාන දිහා බලාගෙන කුරුමානම් අල්ලනවා. ඔහොම බලාගෙන ඉඳලා ඉඳලා තමන්ගේ හැන්ද අරගෙන ලේනච්කාගේ පිඟානෙනුත් සුප් බොන්න පටන් ගත්තා. සාෂා බීගෙන බීගෙන ගියා.

ලේනච්කා කෑගාලා ඇඩුවා.

"අනේ, සාෂා මගේ සුප් එකත් බොනවා."

ඒ කතාවට සාෂාට කේන්තියක් ආවා.

"මම මේ සුප් බොනවා නෙවෙයි, ලේනච්කාට උදව් කරනවා"

එතකොට ලේනච්කා මෙහෙම කිව්වා:

"මට උදව් ඕනැ නෑ. සුප් බොන හැටි මම දන්නවා"

ගුරුතුමිය අලුත් බොකුටු පිඟානකට අලුතෙන් සුප් වත්කරලා ලේනච්කාට දුන්නා. ඇය හැන්දෙන් කොච්චර වේගයෙන් සුප් ටික බිව්වද කිව්වොත් හැමෝම පුදුම වුණා.







# ළමයින් සෙල්ලම් කළ හැටි

"මේන් බලන්නකෝ, මං ඔයාලට සෙල්ලම් කරන්න අරගෙන තිබේබේ මොනවද කියලා" කී ගුරුතුමිය අල්මාරියෙන් ලොකු පෙට්ටියක් එළියට ගත්තා. ඒක මේසෙ උඩ තියලා පියන ඇරියා. ඒක ඇතුළෙ තිබුණෙ ලීයෙන් කපාපු ලොකු, පොඩි බෝනික්කො.

"ලොකු බෝනික්කි තමයි අම්මා, පොඩි එකී කාත්යා දුව. දැන් හැමෝම මෙතෙන්ට ඇවිත්, කැමති අය බෝනිකි අම්මලාවත්, කැමති අය කාත්යා බෝනිකි දුවලාවත් අරගන්න" කියලා ගුරුතුමිය කීවා.

බෝනික්කන් තෝරාගත්ත ළමයි මේසෙ වටේට වාඩි වුණා. බෝනිකි අම්මලා වැඩට යන්න කලබලේ ලකලෑස්ති වෙනවා. දුවලා අම්මලාට වැඳලා සෙල්ලම් කරමින් ඇවිදින්න යන්න ගියා. කාමරය පුරාම දුව දුවා හැම තැනටම හොට දාලා බලනවා. කුරුලු කූඩුව ළඟට ඇවිත් කුරුල්ලන්ව බය

කළා, බෝනික්කන් ළඟට ඇවිත් බෝනික්කන් බය කළා, පොත් රාක්කයට එබිකම් කර බැලුවා. සාෂාගේ කාත්යා දුව කාරයේ වාඩි වෙලා බලලා, ලොරියට නැගලා මුළු කාමරේ පුරාම ගියා. ඕල්යා එයාගේ කාත්යා දුව කරත්තයේ තියාගෙන තල්ලු කරගෙන ගියා.

ගුරුතුමිය සින්දුවක තාලයක් අල්ලලා අත්පොළසන් දුන්නා. ඒ තාලෙට කාත්යා දූලා ඔක්කොම නැටුවා, එක්කෙනෙකුට එක්කෙනෙක් පරදින්නෙ නෑ. ඇති වෙනතුරු ඇවිදලා, ඇති වෙනතුරු සෙල්ලම් කළාට පස්සෙ ගෙදර යන්න වෙලාව ළංවුණා. බෝනිකි අම්මලා වැඩ ඇරිලා ඇවිත් රෑට කෑමත් උයලා, ළමයි ගෙදර එනතුරු බලාගෙන ඉන්නවා. ඒ අය තමන්ගෙ දූවරුන් මේසය වටේ වාඩිකරවලා මෙහෙම කියනවා.

"කන්න, කන්න, බඩ පිරෙන තුරු කන්න, ඉතුරු කරන්න එහෙම එපා."

කාත්යා දූලා හැමෝම ඉවරවෙන්නම කෑවා. දැන් දූලාව නිදි කරවන්න ඕනැ. ගුරුතුමිය හැමෝටම පෙට්ටිය ගානෙ දුන්නා. ඒ පෙට්ටිය ඇතුළෙ පුංචි කොට්ටයකුයි, පොරෝනයකුයි තිබුණා. ඒ තමයි දූලාගේ ඇඳන්.

ලොකු බෝනිකි අම්මලා එයාලගේ දූවරුන් නිදි කෙරෙව්වා. පෙර පාසලේ ළමයි ටික පෙට්ටි ඇඳන් මේසය උඩ පේළියෙන් පේළියට තිබ්බෙ හරියට ම පෙර පාසලේ නිදන කාමරයේ ඇඳන් පේළි තියෙලා තියෙනවා වගේ. ලොකු බෝනිකි අම්මලා ටික ජනෙල් පඩිය දිගට තිබ්බා.

"අපි දැන් සෙල්ලම් කරන්න යමු. අම්මලා ජනේලයෙන් අප දිහා බලාගෙන ඉඳීවි."

ඇඳුම් ඇඳ ගන්න තැනට හිමින් හිමින් ගිය ළමයි ටික කතා බහ කළෙත් ඇහෙන නෑහෙන ගාණට. මොකද බෝනිකි පොඩිත්තියන් නින්දෙන් අවදි වෙයි කියලා බයට. ළමයි සෙල්ලම් කරලා එනතුරු බෝනිකි දූලා සැපට නිදාගත්තුදෙන්.



# මහ පාරේදී ළමුන් දුටු දේ

මහ පාරේ පයින් ඇවිදගෙන යනකොට ළමයි දැකපු දේ බොහෝයි. අලුතෙන්ම හදපු විශාල තට්ටු නිවාසයක්, අලුත්ම දිලිසෙන බස් රථයක්, දිග ලොරියක්, යතුරු පැදියක නැගලා යන පොලිස් මාමා කෙනෙක්, උඩට ඇදලා දික්කරන්න පුළුවන් ඉනිමඟක් සවි කර තියෙන ගිනි නිවන හමුදාවේ රථයක්, කිරි ගෙනියන බවුසරයක්, නොයෙක් වර්ගයේ කුඩා මෝටර් කාර්, විදුලි රැහැන් පිළිසකර කරන උස ස්වංක්‍රීය ඉනිමඟක් ඇති ලොරි රථයක්.







# පුංචි මාලුවා

අලුතින් පෙර පාසැලට ඇතුළත් වුණු පුංචි ළමයින් ඉන්න පන්ති කාමරයේ ජනේලය ළඟ පොඩි මේසයක් උඩ මාලු ටැංකියක් තියලා තිබුණා. ඒකේ පුංචි මාලු පැටවු හිටියා. පුංචි ළමයි ඉන්න තැන මාලු පැටවුන් හිටියෙත් හරි සතුටින්. මාලු ටැංකිය හැම දාම හොඳට සෝදලා පිරිසිදු කරලයි තිබුණෙ. හැම දාම පරණ වතුර අයින් කරලා ඒක අලුත් වතුරෙන් පුරවනවා. ඒක පතුලේ වැලි අතුරලා, ගල් තියලා, බෙල්ලන් තියලා, වතුරෙ හැදෙන තණ වර්ගත් හැදෙනවා.

හැම දාම උදේම ළමයි මාලුන්ට කෑම දෙනවා. පොඩි තේ හැන්දකින් කෑම වතුර උඩට ඉහිනවා. ගුරුතුමිය එක්ක එකතුවෙලා ළමයි මාලු ටැංකිය හෝදලා, වතුර මාරු කරනවා.

එක දවසක් ගුරුතුමිය ලොකු වතුර බේසමක් අරගෙන ආවා. මාලු ටික බේසමට දාලා ටැංකිය හෝදන්න පටන්ගත්තා. ළමයි බේසම වටේ ඉඳගෙන රන්වන් මාලුත් පොඩි කාප් පැටවුනුත් පීනන හැටි බලාගෙන හිටියා.

"මගේ බෝනික්කි පුතාටත් මාලු බලන්න ඕනැලු" ලේනච්කා කිව්වා.

"හා, එන්න බලන්න"

ළමයි ඇත්ච් බෝනික්කි පුතාට ඉඩ දුන්නා. බෝනික්කි පුතා වතුර බේසමට ඇලවෙලා මාලු බලන්න හැදුවා විතරයි, එහෙම්මම බේසමට ඇදගෙන වැටුණා. බේසමේ වතුර ඉහිරිලා බිමට වැටුණා. ඒත් එක්කම රන්වන් මාලුවෙකුත් බිමට වැටුණා. බිමට වැටිලා ලොකුවට කට ඇරගෙන දඟලනවා.

ළමයින්ට කෑගැහුණා. බිම වැටිලා හිටිය මාලුවාව අහුලාගත්ත ගුරුතුමිය එසැණින් ඌ වතුරට දැම්මා. මාලුන්ට වතුර නැතිව ජීවත් වෙන්න බැහැනේ.

# පූස් පැටියා

දවසක් දා අලුත් ළමයින් ඉන්න පන්තියට ගුරුතුමිය කූඩයක් අරගෙන ඇවිත් මෙහෙම කිව්වා:

"කන් උල් හැඩ ඇති,
පයේ කොට්ට ඇති,
උඩු රැවුලක් ඇති,
කුඩු කොන්දක් ඇති,
දවල්ට නිදියයි, අව්වට පිරියයි,
රෑට ගමනෙමයි, දඩයම් කෙරුමයි,
ආ... කියන්න බලන්න කවුද කියලා"

ළමයින්ගෙන් කිසිම උත්තරයක් නෑ, ඒ තේරවිල්ල තෝරන්න ළමයින්ට බැරි වුණා.

ඒත් ටික වෙලාවකින් තේරවිල්ල කූඩෙන් බෙල්ල එළියට දාපු නිසා තෝරන්න දෙයක් ඉතුරු වුණේ නෑ.



# කවරකු වන්නද මං?

ළමයි වාඩිවෙලා කතා කරකර හිටියා.

"මම ගුවන් නියමුවකු වෙනවා"

"මං දුම්රිය රියදුරකු වෙනවා"

"මං බස් රියදුරකු වෙනවා"

"මං නාවිකයෙක් වෙලා, දුම් නැවක නැගිලා සාගර තරණය කරනවා"

"මං දොස්තර මහත්තයෙක් වෙලා හැමෝටම ප්‍රතිකාර කරනවා"

"මගේ ආසාව ගුරුවරියක් වෙන්නයි" ලේනච්කා කිව්වා.

"උසම උස, ලස්සනම ලස්සන ගොඩනැගිලි ඉදිකරන එක තමයි මගේ බලාපොරොත්තුව" කියලා ඕල්යා කීවා.


හැමෝම තමන්ගේ අනාගත බලාපොරොත්තු ගැන කීවත් සාෂාත් අලෝෂාත් මොකවත්ම කීවේ නෑ.

"ඔය දෙන්නා ලොකු වුණාම මොනවා කරන්නද හිතාගෙන ඉන්නේ?"

ටිකක් වෙලා කල්පනා කරපු මේ දෙන්නා මෙහෙම උත්තරයක් දුන්නා.

"අපි ලොකු වුණාම තාත්තත් එක්ක පැක්ටරියේ වැඩට යනවා"





# ඕල්යාගේ තාත්තා ළමයින්ට ගෙයක් හදන්න කියා දුන් හැටි

ඕල්යාගේ තාත්තා දවසක් දා පෙර පාසලට ආවා. එයා වැඩ කළේ ඉදිකිරීම් වැඩපොළක. "අපට කියා දෙන්නකො ලොකු ගොඩනැගිලි හදන්නේ කොහොමද කියලා" ළමයි ඉල්ලා හිටියා.

"අපි හැමෝම එකතු වෙලා ගොඩනැගිල්ලක් හදමු. එතකොට ඔයාලට නිකම්ම ඉගෙන ගන්න පුළුවන් කොහොමද හදන්නේ කියලා" ඕල්යාගේ තාත්තා කිව්වා.

තාත්තා කඩදාසියක් අරගෙන ගොඩනැගිල්ලක් ඇන්දා.

"අපි මේ වගේ ගෙයක් හදමු. කොතැනද ගේ හදන්නෙ? තැන තෝරාගෙන මුලින්ම බිම සකස් කරගෙන ඉන්න ඕනෑ."

ළමයි ටික සෙල්ලම් බඩු අයින් කරලා පුටු පැත්තකට කළා.

ඉතින් ගේ හදන තැන තීන්දුයි. දැන් ගොඩනැගිලි ද්‍රව්‍ය ගෙනැවිත් දාගන්න පුළුවන්. සද්දෙ දාගෙන ලොරි එහාට මෙහාට ගියේ හැබෑම ගොඩනැගිල්ලක් ඉදිකරන තැනක වගේ. බිත්ති බඳින්න ගඩොල්, වහලයට බාල්ක එහෙම ළමයි ලොරිවල පටවාගෙන අරගෙන ආවා. ගුරුතුමිය කාඩ්බෝඩ්වලින් කපලා දීපු පෙර සවි ජනෙල්, දොරවල් ළමයි ලොරිවලින් ගෙනැවිත් බෑවා.

"හැබෑ ගොඩනැගිල්ලක් හදනකොට, ඉදිකිරීමට වුවමනා ද්‍රව්‍ය උඩට ගෙනියන්නෙ දොඹකරයෙන්. දොඹකරය ගමන් කරන්නේ පීලි උඩ. ගඩොල් පුරවාපු වානේ මලු, යකඩ කොක්කෙන් උස්සාගෙන දහ වැනි තට්ටුවට, ඕනෑ නම් ඊටත් වඩා ඉහළට ගෙනියන්නේ දොඹකරයෙන්. අපේ වැඩ ටික දොඹකරයක් නැතුව කරගන්න පුළුවන්. අපි ගඩොල් ටික අතින් අත යවමු.



හැබැයි පරක්කු වෙන්නෙ නැතුව මේසන් බාස්ලා බිත්ති ටික බැඳ දාන්නයි, වඩු බාස්ලා වෙලාවට ජනෙල් දොරවල් ටික අල්ලන්නයි ඕනැ"

ළමයි ඔක්කොම කඩිමුඩියෙ වැඩ. ඒ නිසා පළමු තට්ටුව ඉක්මනින් හදලා ඉවර වුණා. දැන් දෙවැනි තට්ටුවේ වැඩ. ශක්තිමත්ව ගොඩනැගිල්ල ඉදිවෙනවාද කියාත් පින්තූරයේ ඇඳ තිබෙන හැටියට, කිසිම අඩුපාඩුවක් නැතිව, නිවැරදි ආකාරයෙන් නිවස ඉදිවෙනවාද කියාත් බලන්න ඕල්යාගේ තාත්තා එහෙ මෙහෙ දිව්වා.

ළමයි ඉක්මනින්ම මහල් නිවාසය ඉදිකරනවා. දැනටමත් බිම් මහලේ වැඩ අවසන්. දෙවැනි මහලේ බිත්තිවල තීන්ත ගානවා. තුන් වැනි තට්ටුවේ කපරාරුව ගහනවා. උඩම තට්ටුවේ වහලෙ හදන වඩු බාස්ලා හැටියට වැඩ කරන අපේ පොඩිත්තො ලීයෙන් හදාපු මිටිවලින් ගහලා වහලය හදනවා. දැන් ඉතුරු වෙලා තියෙන්නෙ වතුර බිත්ති දිගේ පහළට බේරෙන එක වලක්වන්න වහලය වටේ වඩිම්බු ගහලා පීලි දාන්න විතරයි.

අනික් අය මේ මහල් නිවාසය වටේ කැලි කසල සුද්ද කර දානවා, ගස් හිටවනවා, වාහන නවත්වන්න තැනක් හදනවා. දැන් වැඩ ඉවරයි. ඉතුරු වෙලා තියෙන්නෙ ගිහින් පදිංචි වෙන්න විතරයි.

ඕල්යාගේ තාත්තා පින්තූරයේ ඇන්දා වාගේම ලස්සන මහල් නිවාසයක් දැන් ඉදිවෙලා තියෙනවා.

මේ මහල් නිවාසයට හැමෝම කැමතියි. මොකද දන්නවද? තමන්ගෙම මහන්සියෙන්නෙ ඒක ගොඩනගා ගත්තෙ.



# උදෙන්ම පෙර පාසල් යන්න ළමයි මේ තරම් කැමති ඇයි?

පෙර පාසලේදී යාලුවෝ ටික ඔක්කොම එකට එකතු වෙන නිසා. ඔක්කොටම එකට දුවන්න, පනින්න, සෙල්ලම් කරන්න වගේම, පාඩම් කරන්නත් පුළුවන් නිසා.

ගුරුතුමියත් එක්ක ඇත්තම මහල් නිවාසයක් ඉදිවෙන හැටි බලන්න යන නිසා. ළමයි ලොකු වුණාම ඒ වගේම විශාල මහල් නිවාසයක් ඒ අයත් ගොඩනගනු ඇති නිසා.

නාවිකයෙක් වන ලේනච්කාගේ තාත්තා ඊයේ පෙර පාසලට ඇවිත් විශාල මුහුදු නැව් ගැන කතාන්දර කියූ නිසා.


සමහර විට අදත් කාගේ හෝ තාත්තා කෙනෙක් හරි අම්මා කෙනෙක් හරි ඇවිත් ඒ වගේ හිත ඇදී යන කතා කියනු ඇති නිසා.


ඔිල්යායි, සාෂායි, ලේනච්කායි විතරක් නෙවෙයි අනික් ළමයිනුත් එකතුවෙලා මල්වලට වතුර දාන නිසා, මාලු පැටවුන්ට කෑම දාන නිසා, ගිරා පැටියගෙ දුක සැප හොයා බලන නිසා. කූඩුවටම හිර වෙලා ඉන්න පෙත්තප්පු ළමයින් පෙර පාසලට එනතුරු බලාගෙන ඉන්නවා. එයාගේ කූඩුව පිරිසිදු කරන්න තියෙන නිසා, එයාගේ කෑම භාජනය පිරිසිදු කරන්න තියෙන නිසා, එයාට කෑමට වී, කවුපි, පිරිප්පු වගේ ධාන්‍ය ඇට දෙන්න තියෙන නිසා.

ලොකු වලස් බෝනික්කා අස්සයා පිටේ නැගලා අලෝෂාව පිළිගන්න ඉදිරියට එන නිසා. වලස් බෝනික්කට කැට කැබලිවලින් නිවසක් සාදා දෙන්න තියෙන නිසා. අස්සයාව ඉස්තාලයට ගෙනිහින් ගැටගහන්න තියෙන නිසා.

ගුරුතුමිය රසවත් සුරංගනා කතාවක් කියනු ඇති නිසා, ලස්සන පින්තූර ඇඳලා තියන කතාන්දර පොත් අරගෙන එනු ඇති නිසා, පාට පැන්සල්වලින් චිත්‍රයක් පාට කරන්න දෙනු ඇති නිසා, අලුත් විනෝද ක්‍රීඩාවක් කියා දෙනු ඇති නිසා.

අන්න ඒ නිසයි, ළමයි උදෙන්ම පෙර පාසල් යන්න පොර අල්ලන්නෙ.


















**Kanol Publishing House**
1196/4, Kottawa Road, Pannipitiya
Tel: 011 4336778, 071 3493447
kanolpublish@gmail.com

ISBN 978-955-1979-72-0
9 789551 979720

kanolbooks.blogspot.com

Rs. 200/-